කලාප අධ්‍යාපන කාර්යාලය - රත්නපුර

කාර්ය පත්‍රිකාව

විෂය- ව්‍යාපාර සංඛ්‍යානය

**සංඛ්‍යාන අනුමිතිය සඳහා නියැදි මධ්‍යනා‍ය දෙකක අන්තරයෙහි නියැදුම් ව්‍යාප්ති ගොඩ නගයි.**

ශ්‍රේණිය - 13

පාඩම - 1

නිපුණතාව 7.0 - ව්‍යාපාරික තීරණ ගැනීම සඳහා සංඛ්‍යාන නිමානය යොදා ගනියි.
නිපුණතා මට්ටම 7. .3 - සංඛ්‍යාන අනුමිතිය සඳහා නියැදි මධ්‍යනා‍ය දෙකක අන්තරයෙහි නියැදුම් ව්‍යාප්ති ගොඩ නගයි.

 සංගහන දෙකකින් සසම්භාවීව ගත හැකි සියලුම ස්වායත්ත නියැදිවල මධ්‍යනා‍යයන්හි අන්තරය සඳහා ගත හැකි අගයන්ගේ සම්භාවිතා ව්‍යාප්තිය නියැදි මධ්‍යනා‍ය දෙකක අන්තරයෙහි නියැදුම් ව්‍යාප්තිය ලෙස හැඳින්විය හැකිය.

<u>**ඇගයීම**</u>

1.)A - සංගහනය 4,8,12
B - සංගහනය 2,4,6

- A සංගහනයෙන් තරම දෙක බැගින් වූ ප්‍රතිස්ථාපන රහිතව ගත හැකි සියලු නියැදි ගණන කීයද?
- B සංගහනයෙන් තරම දෙක බැගින් වූ ප්‍රතිස්ථාපන රහිතව ගත හැකි සියලු නියැදි ගණන කීයද?

2.)එක්තරා විද්‍යාලත සිසුන්ගේ බරෙහි මධ්‍යනා‍යය 48kg සහ සම්මත අපගමනය 5kg වේ.එම විද්‍යාලේ සිසුවියන්ගේ මධ්‍යනා‍ය බර 45kg හා සම්මත අපගමනය 8kg වේ.

(අ.)සිසු සිසුවියන්ගේ බර ප්‍රමතව ව්‍යාප්ත වේ යයි උපකල්පනය කරන්නේ නම්,

(i) සසම්භාවී ව තෝරා ගත් සිසුන් 25දෙනෙකුගේ මධ්‍යනා‍ය බර,සසම්භාවී ව තෝරා ගත් සිසුවියන් 16 දෙනෙකුගේ මධ්‍යනා‍ය බරට වඩා වැඩි වීමේ සම්භාවිතාව කොපමණද?

(ii)සසම්භාවී ව තෝරා ගත් සිසුන් 49 දෙනෙකුගේ මධ්‍යනා‍ය බර සසම්භාවී ව තෝරා ගත් සිසුවියන් 64 දෙනෙකුගේ නියැදියක මධ්‍යනා‍ය බරට වඩා වැඩි වීමේ සම්භාවිතාව කොපමණද?